# දරුවන් උදෙසා බයිබලයක්



# සභාවේ උපත

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



ජේසුස් වහන්සේ මිය ගිය විට, බියට පත් වූ
උන්වහන්සේගේ ගෝලයෝ සැඟවුනෝය. ජේසුස්
වහන්සේ මළවුන්ගෙන් නැඟිටීමෙන් පසු, ඔහු තම
ගෝලයන්ට පෙනුණු සේක. ජේසුස් වහන්සේ
ජීවමානව සිටි සේක! නමුත් ජේසුස් වහන්සේ ඔවුන්
හැරගොස්, තම පියවූ දෙවියන් වහන්සේ සමඟ
ජීවත් වූ ස්වර්ගයට ආපසු යෑමට සැළසුම් කළ සේක.



උන්වහන්සේ
පිටත්ව යාමට
පෙර, තම ගෝලයින්ට පොරොන්දු
වූයේ දෙවියන් වහන්සේගේ ආත්මය
ඔවුන්ගේ සහනය සහ උපකාරය
සඳහා එවන බවය. (ශු. යොහන් 15:26). කාලය ආසන්න විය!
ජේසුස් වහන්සේ නික්ම ගොස් දින කිහිපයකට පසු,
ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි සේක!

එය සිදුවූයේ මේ ආකාරයෙනි. ජේසුස් වහන්සේගේ අනුගාමිකයෝ 120 ක් පමණ නිවසක එකට යාච්ඤා කරමින් සිටියෝ්ය. එක්වරම හමා එන තද සුළඟක හඬින් නිවස පිරී ගියේය.



එක් එක් පුද්ගලයා මත ගිනිදැල් රැඳී තිබුණි. ඔවුහු සියල්ලෝම ජේසුස් වහන්සේ පොරොන්දු වූ පරිදිම ශුද්ධාත්මයාණන්ගෙන් පිරී සිටියෝය.



ජේසුස් වහන්සේගේ අනුගාමිකයෝ වීදිවල, ඔවුන් කිසිදා ඉගෙන නොගත් භාෂා වලින් කතා කළෝය. යෙරුසලමට ගිය විදේශිකයන්ට, දෙවියන් වහන්සේගේ  පුදුම ක්‍රියා ගැන ගෝලයින් විවිධ භාෂාවලින් කතා කරනවා ඇසුණි. ඒ අමුත්තන් පුදුමයට පත් විය. "මෙ◌් සිදුවන දේවල් වල තේරුම කුමක්ද?" ඔවුහු ඇසුවෝය. "ඔවුන් අලුත් වයින් බී මත්වී ඇතැ" යි තවත් සමහරු සමච්චල් කළෝය.



නමුත් පේදුරු, "මොවුන් බීමත්ව නොවේ. අනාගතවක්තෘ යෝවෙල් විසින් කියන ලද්දේ මේ ගැනයැ" යි කීවේය.
මිනිසුන්ට ආශීර්වාද කිරීමට සහ උපකාර කිරීමට වසර ගණනාවකට පෙර දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ එවන බවට පොරොන්දු වූ බව පේදුරු ඔවුන්ට මතක් කර දුන්නේය.



පේදුරු මිනිසුන්ට ඔවුන් තම පාපයෙන් ඉවත් වී ජේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන් බව්තීස්ම විය යුතු බව කීවේය. “එවිට ඔබට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලැබෙනු ඇත,” පේදුරු කීවේය. මිනිස්සු 3000 ක් පමණ කීකරු වූවෝය. ඔවුහු ජේසුස් වහන්සේ හට නමස්කාර කරන්නන් ලෙස ගෝලයන් සමඟ එකතු වූවෝය.




කාලය ගෙවී යත්ම, ශුද්ධාත්මයාණන් පැමිණි දිනයේ දෙවියන් වහන්සේ ආරම්භ කළ සභාවට වැඩි වැඩියෙන් ජනතාව එකතු වූවෝය.

ශුද්ධාත්මයාණන් වහන්සේ, උන්වහන්සේගේ බලය දේව ජනතාවගේ ජීවිතවලට ගෙන ආ සේක. එක් දිනක් පේදුරු සහ යොහාන් යාච්ඤා කරන වෙලාවේ දේවමාළිගාවට ගියෝය. දේවමාළිගාවේ ගේට්ටුවෙන් පිටත කොරවූ සිඟන්නෙක් වාඩි වී සිටියේය. ඔහු පේදුරු සහ යොහාන්ගෙන් මුදල් ඉල්ලුවේය.





එවිට පේදුරු “මා ළඟ රිදී රන් නැත, නමුත් මා සතු දේ මම ඔබට දෙමි: නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් නැඟිට ඇවිදින්නයැ” යි කීවේය. පේදුරු දකුණු අතින් අල්ලා ඔහුව ඔසවා තැබුවේය. ඔහු, උඩ පැන, නැගිට, ඇවිදිමින් ඔවුන් සමඟ දේවමාළිගාවට ඇතුළු විය. ඇවිදිමින්, උඩ පනිමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේය.

ප්‍රාතිහාර්යය දැක විශ්මයට පත්වූ මහත් සමූහයක් රැස්ව සිටියෝය. ආබාධිත මිනිසාව සුව කළේ තමාගේ බලයෙන් නොව දෙවියන් වහන්සේගේ  බලයෙන් බව පේදුරු ඔවුන්ට කීවේය. දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේව මළවුන්ගෙන් උත්ථාන කළ බව පේදුරු මෙම යුදෙව්වන්ට මතක් කර දුන් විට, දේවමාළිගාවේ නායකයෝ කෝපයෙන් පේදුරු සහ යොහන් අල්ලා සිරගත කළෝය. කෙසේවෙතත්, මිනිස්සු 5000 ක් පමණ ජේසුස් වහන්සේව විශ්වාස කළෝය.



ඊළඟ දවසේ පේදුරු සහ යොහාන් දේවමාළිගාවේ පාලකයන් ඉදිරියේ පෙනී සිටියෝය. “ඔබ මෙය කර ඇත්තේ කුමන බලයකින් හෝ කුමන නමකින්ද?” පාලකයෝ විමසුවෝය. ශුද්ධාත්මයාණන්ගෙන් පිරුණු පේදුරු නිර්භීතව පිළිතුරු දුන්නේය. “... ඔබ කුරුසියේ ඇණ ගැසූ නමුත් දෙවියන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ, නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන්ය. උන්වහන්සේ කරණකොටගෙන මේ මනුෂ්‍යයා ඔබ ඉදිරියේ සම්පූර්ණව සිටින්නේය”.





පේදුරු නොබියව තව දුරටත් කතා කළේය, “..අපට ගැළවීම ලැබෙන වෙනත් නාමයක් අහස යට නැත.” මිනිසුන් ජේසුස් වහන්සේව විශ්වාස කරනු දකින්නට පාලකයන් අකමැති හෙයින්, ඔවුහු පේදුරු සහ යොහන්ට තදබල ලෙස තර්ජනය කළෝය. “මෙතැන් පටන් ඔබ, කිසි කෙනෙකුට ජේසුස් වහන්සේගේ නාමයෙන් කතා නොකළ යුතුය.”



පේදුරු වරක්
ජේසුස් වහන්සේ
වෙනුවෙන් පෙනී
සිටීමට බිය
වූයේය. නමුත් ඒ
ශුද්ධාත්මයාණන්
පැමිණීමට පෙරය.
දැන් කිසිවෙකුට
ඔහුව බිය
ගැන්වීමට
නොහැකිය.



පේදුරු සහ
යොහන් පිළිතුරු
දෙමින්, “දෙවියන්
වහන්සේට වඩා
ඔබට ඇහුම්කන්
දීම දෙවියන්
වහන්සේ ඉදිරියෙහි
යුතුද කියා ඔබම
විනිශ්චය කරන්න.
මක්නිසාද අප
දුටුවාවූ හා ඇසුවාවූ
දේ ගැන කතා
නොකර සිටීමට
අපට නොහැකියැ”
යි කීවෝය.

තවත් තර්ජන
කිරීම් කළ පසු
පාලකයෝ පේදුරු
සහ යොහාන්ව නිදහස්
කළෝය. දෙවියන්
වහන්සේගේ නිර්භීත
සේවකයෝ සිරගෙදර
සහ උසාවිය ගැන තම
අනෙක් සගයන්ට
කීවෝය. ඉන්පසු ඔවුහු
මහත් යාච්ඤාවක් හා
ප්‍රශංසා රැස්වීමක්
පැවැත්වූවෝය. නැවතත්,
දෙවියන් වහන්සේගේ
ශුද්ධාත්මයාණන්
උන්වහන්සේගේ සෙනඟ
බලයෙන් පිරවූ සේක. කුඩා
සභාව ක්‍රමයෙන් වර්ධනය විය.



සභාවේ උපත

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ක්‍රියා 1 - 4

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)